# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 21 දරන
# ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය පනත

---

[සහතිකය සටහන් කළේ 1985 ජූනි මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1985 ජූනි මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිල : රු. 2.70 තැපැල් ගාස්තුව : රු. 1.80

# 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය පනත

[සහතිකය සටහන් කළේ 1985 ජූනි මස 07 වීන දින]

එල්. ඩී.—ඕ. 4/84.

**ශ්‍රී ලංකා, විදේශ සේවානියුක්ති කාර්යාංශය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, එහි බලතල හා කාර්ය විධිමත් කිරීම පිණිස ද, 1980 අංක 32 දරන විදේශ සේවානියුක්ති නියෝජිත යතන පනත ඉවත් කිරීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

1. මේ පනත 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

*මේ පනත අදාළ කිරීම.*

2. පෞද්ගලික අංශයේ ව්‍යවසායක් විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

## I වන කොටස

### ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය පිහිටුවීම

*ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය පිහිටුවීම.*

3. (1) (මෙහි මින් මතු "කාර්යාංශය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය යනුවෙන් හඳුන්වනු ලබන කාර්යාංශයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කාර්යාංශය (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද ඒ නාමයෙන් කාර්යාංශය විසින් නඩු පැවරීම සහ ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

*කාර්යාංශයේ සාමාජිකයෝ.*

4. කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් කාර්යාංශයේ සාමාජිකයන් විය යුතු ය.

*අධ්‍යක්ෂ මණ්ඩලය.*

5. (1) කාර්යාංශයේ (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් විය යුතු අතර එය පහත දැක්වෙන සාමාජිකයන් එකොළොස් දෙනාගෙන් සමන්විත විය යුතු ය:—

(අ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අදහස් විමසා අමාත්‍යවරයා විසින් පත් කරන ලද එක් සාමාජිකයෙක්;

2—ඒ 082480—6775, (85/0

(ආ) විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් පත් කරන ලද එක් සාමාජිකයෙක් ;

(ඇ) වනිතා කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් පත් කරන ලද එක් සාමාජිකාවක් ;

(ඈ) අමාත්‍යවරයා විසින් පත් කරන ලද වෙනත් සාමාජිකයන් අට දෙනෙක් ; ඔවුන් අතුරින් සතර දෙනකු මේ පනත යටතේ බලපත්‍ර ලත් විදේශ සේවානියුක්ති නියෝජිතායතනවල නියෝජිතයන් විය යුතු ය.

(2) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වෙතොත් ඔහු අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එලෙස කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු විය යුතු ය.

(3) සෑම අධ්‍යක්ෂවරයකු ම, ඔහු කලින් ඉල්ලා අස්වුවහොත්, මියගිය හොත් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අවුරුදු දෙකක කාලයක් ධූරය දැරිය යුතු ය.

(4) අමාත්‍යවරයා වෙත යොමු කරන ලද ලිපියක් මගින් අධ්‍යක්ෂවරයකුට තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) ඉල්ලා අස්වීමෙන් හෝ තම ධූර කාලය ඉකුත්වීමෙන් හෝ තම ධූරය හිස් කරන අධ්‍යක්ෂවරයෙක් නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(6) (අ) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා යම් අධ්‍යක්ෂවරයකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ආ) ධූරයෙන් ඉවත් කරනු ලැබූ අධ්‍යක්ෂවරයකු, අධ්‍යක්ෂවරයකු වශයෙන් හෝ වෙනත් යම් තත්ත්වයකින් කාර්යාංශයෙහි සේවය කිරීම හෝ නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු නොවිය යුතු ය.

(7) (අ) තම ධූර කාලය ඉකුත්වීමෙන් නොව අන්‍යාකාරයකින් අධ්‍යක්ෂවරයකු තම ධූරය හිස් කළහොත්, අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිල්ල ඇතිව, එසේ ධූරය හිස් කරන අධ්‍යක්ෂවරයා වෙනුවට අධ්‍යක්ෂවරයකු වීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදය යටතේ පත් කරන ලද යම් අධ්‍යක්ෂවරයකු තම ධූරය කලින් හිස් කළහොත් මිස ඔහුගේ පූර්වගාමියාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධූරය දැරිය යුතු ය.

(8) රෝගාතුරවීමේ හෝ වෙනත් අබලතාවක හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන් තම ධූරයේ කාර්ය ඉටු කිරීමට අධ්‍යක්ෂවරයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක ඒ නොහැකියාවේ හෝ බැහැරව සිටීමේ කාලය තුළ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට සුදුසු තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

*කාර්යාංශයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම.*

6. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරය සහ අනුප්‍රමාණ අනුව කාර්යාංශයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

*කාර්යාංශය ඇති කිරීමට යන ගිවිසුමක් පිළිබඳ සම්බන්ධතාව කාර්යාංශයේ සාමාජිකයන් හෙළි කළ යුතු බව.*

7. කාර්යාංශය විසින් ඇති කරන ලද හෝ ඇති කිරීමට යෝජිත යම් ගිවිසුමක් පිළිබඳව කෙළින් ම හෝ අනියම් ලෙස සම්බන්ධතාවක් ඇති අධ්‍යක්ෂවරයකු විසින් ඔහුගේ සම්බන්ධතාවේ ස්වභාවය මණ්ඩලයේ රැස්වීමක දී හෙළි කළ යුතු ය. ඒ හෙළි කිරීම මණ්ඩලයේ වාර්තාවෙහි වාර්තා කරනු ලැබිය යුතු අතර ඒ අධ්‍යක්ෂවරයා ඒ ගිවිසුම සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගී නොවිය යුතු ය:

එසේ වුවද, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක නිලධරයකු වශයෙන් හෝ රාජ්‍ය සංස්ථාවක අධ්‍යක්ෂවරයකු වශයෙන් ගිවිසුමක් පිළිබඳව කාර්යාංශයේ යම් අධ්‍යක්ෂවරයකුට තිබිය හැකි සම්බන්ධතාව මේ වගන්තියේ අර්ථානුකූලව සම්බන්ධතාවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

*මණ්ඩලයේ රැස්වීම්වල ගණපූරණය සහ කාර්ය පටිපාටිය විධිමත් කිරීම.*

8. මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සඳහා සාමාජිකයන් පස් දෙනකු සිටිය යුතු ය. මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්, මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

*මණ්ඩලයේ ක්‍රියාවල හෝ කටයුතුවල වලංගු භාවය.*

9. මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන් අතර යම් පුරප්පාඩුවක් හෝ යම් අධ්‍යක්ෂවරයකුගේ පත්වීම පිළිබඳ වූ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම, මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

*මණ්ඩලයේ සාමාජිකයන් විසින් කාර්යාංශයේ කටයුතු පරිපාලනය කළ යුතු බව.*

10. මණ්ඩලය විසින් කාර්යාංශයේ කටයුතු පරිපාලනය කළ යුතු අතර, ඒ කාර්යය සඳහා කාර්යාංශයේ සියලු බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

*මණ්ඩලයේ බලතල සහ කාර්ය පැවරීම.*

11. (1) කාර්යාංශයේ කටයුතු කාර්යක්ෂම ව පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය ස්වකීය බලතල සහ කාර්ය කිසිවක් මණ්ඩලය විසින් සභාපතිවරයාට, අධ්‍යක්ෂවරයකුට හෝ කාර්යාංශයේ සේවානියුක්තයකුට හෝ පවරා දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලයක් හෝ කාර්යයක් පවරා දෙනු ලැබූ සෑම තැනැත්තකු විසින් ම, මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් ව, ඒ බලය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා.

12. (1) අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයන් අතුරින් මණ්ඩලයේ සභාපතිවරයා පත් කරනු ලැබිය යුතු ය.

(2) රෝගාතුරවීමෙන් හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන් හෝ තම ධුරයේ කාර්ය ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයාට තාවකාලිකව නොහැකි වෙතොත් ඔහු වෙනුවට ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ සියලු රැස්වීම්වල දී සභාපතිවරයා මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමක දී සභාපතිවරයා පැමිණ නොසිටිය හොත්, පැමිණ සිටින අධ්‍යක්ෂවරයන් විසින්, ඒ රැස්වීමේ මූලාසනය දැරීමට ඔවුන් අතුරින් එක් අධ්‍යක්ෂවරයකු තෝරා පත් කර ගත යුතු ය.

(4) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා වෙත යොමු කරන ලද ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) අමාත්‍යවරයා විසින්, හේතුවක් නොදක්වා, සභාපතිවරයාගේ පත්වීම අවසන් කරනු ලැබිය හැකි ය.

(6) (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් වූ ඔහුගේ ධුර කාලය විය යුතු ය.

(7) මණ්ඩලයේ යම් රැස්වීමක සභාපතිවරයාට තමාගේම ඡන්දයට අතිරේක ව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

කාර්යාංශයේ මුද්‍රාව.

13. (1) කාර්යාංශයේ මුද්‍රාව මණ්ඩලයේ භාරයේ හෝ මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ කාර්යාංශයේ යම් නිලධරයකුගේ භාරයේ තිබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකින් කාර්යාංශයේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂවරයන් දෙදෙනකු ඉදිරිපිට හෝ අධ්‍යක්ෂවරයන් දෙදෙනකුට පැමිණ සිටිය නොහැකි අවස්ථාවක එක් අධ්‍යක්ෂවරයකු සහ මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් නිලධරයකු ඉදිරිපිට හැර, කාර්යාංශයේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නො තැබිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි, ඒ අධ්‍යක්ෂවරයන් සහ නිලධරයා විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතුය.

කාර්යාංශය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ විධාන.

14. (1) කාර්යාංශයේ කාර්ය ඉටුකිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් කාර්යාංශයට ලිඛිත විධාන දෙනු ලැබිය හැකි අතර කාර්යාංශය විසින් ඒ විධාන ක්‍රියාවේ යෙදිය යුතු ය.

(2) කාර්යාංශයේ දේපළ සහ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් වාර වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ආකෘතියක් අනුව තමාට සපයන ලෙස අමාත්‍ය වරයා විසින් කලින් කල මණ්ඩලයට ලිඛිතව විධාන කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ සෑම විධානයක් ම ක්‍රියාවේ යෙදිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් කාර්යාංශයේ සියලු කටයුතු හෝ ඉන් කිසිවක් හෝ විමර්ශනය කොට වාර්තා කිරීමට අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර එවැනි නියමයක් කරනු ලැබූ විට කාර්යාංශය විසින් ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට නියමය ක්‍රියාවේ යෙදීමට අවශ්‍ය සියලු පහසුකම් සැලසිය යුතු අතර සියලු තොරතුරු සැපයිය යුතු ය.

15. (අ) ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්ති අවස්ථා නැංවීම සහ සංවර්ධනය කිරීම ; කාර්යාංශයේ පරමාර්ථ.

(ආ) විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතනවලට ඒවායේ වැඩීම සහ සංවර්ධනය සම්බන්ධයෙන් සහාය දීම සහ ආධාර කිරීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ ඇති දක්ෂතා සඳහා විදේශ වෙළෙඳපලවල් වර්ධනය කිරීමට පියවර ගැනීම ;

(ඈ) විදේශීය නියෝජ්‍යායතන සමග සේවානියුක්තිය පිළිබඳ නියමයන් සහ කොන්දේසි සාකච්ඡා කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභීන්ට සහාය දීම ;

(ඉ) විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනවල ව්‍යාපාර කටයුතු විධිමත් කිරීම සහ ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීම ;

(ඊ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බඳවා ගැනීමේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතනවලට බලපත්‍ර නිකුත් කිරීම සහ ඒ බලපත්‍රවල නියමයන් සහ කොන්දේසි තීරණය කිරීම ;

(උ) සේවානියුක්ති ගිවිසුම සඳහා ප්‍රමිති ඇති කිරීම සහ සේවානියුක්ති ගිවිසුම් සාකච්ඡා කිරීම ;

(ඌ) බඳවා ගැනීමේ ගිවිසුම් විධිමත් කිරීම පිණිස අදාළ විදේශික බලධරයන්, සේවායෝජකයන් සහ සේවා නියුක්ති නියෝජ්‍යායතන සමග ගිවිසුම්වලට ඇතුළු වීම ;

(එ) සාධාරණ වේතන සහ සේවානියුක්ති සම්මතයන් සහතික කෙරෙන සේවානියුක්තිය පිළිබඳ ආදර්ශ ගිවිසුමක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ඒ) සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලැබ එතෙර යන ශ්‍රී ලාංකිකයන්ට නිකුත් කරන ලද ලේඛනවල නිර්ව්‍යාජත්වය පරීක්ෂා කිරීම ;

(ඔ) ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත වූ සේවානියුක්ති අවස්ථා පිළිබඳ පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු කිරීම ;

(ඕ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා ශ්‍රී ලාංකිකයන් පිටවීම සහ ඒ සේවානියුක්තියෙන් පසු ඔවුන් පෙරළා පැමිණීම සමීක්ෂණය කිරීම සඳහා තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(ක) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධනය සහ ආරක්ෂාව භාරගැනීම ;

(ග) කම්කරු සුභසාධන අරමුදලක් පිහිටුවීම ;

(ච) සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලැබ, එතෙර යන ශ්‍රී ලාංකිකයන් පුහුණු කිරීම සහ හුරු කිරීම බලපත්‍රලාභීන්ගේ සහභාගිත්වය ඇතිව භාර ගැනීම ;

(ජ) සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලැබ එතෙර යන ශ්‍රී ලාංකිකයන්ට ආධාර දීම ;

(ට) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයේ නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගෙන් පරිත්‍යාග සහ දායක මුදල් භාර ගැනීම සහ ඒ ශ්‍රී ලාංකිකයන්ගේ පවුල් පුනරුත්ථාපනය කිරීම්, ඒ පවුල්වලට මග පෙන්වීම සහ උපදෙස් දීම සහ තොරතුරු සහ ආධාර සැලසීම සඳහා, ඒ පරිත්‍යාග සහ දායක මුදල් ප්‍රයෝජනයට ගැනීම ;

(ඩ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයේ නියුක්ත ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් ආයෝජන කටයුතු භාර ගැනීම ;

(ණ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තියෙන් පසුව ශ්‍රී ලංකාවට ආපසු පැමිණෙන ශ්‍රී ලාංකිකයන්ගේ පුනරුත්ථාපනය සඳහා වැඩ සටහන් භාර ගැනීම

කාර්යාංශයේ පරමාර්ථ වන්නේ ය.

**16.** (1) කාර්යාංශයේ පරමාර්ථ ක්‍රියාවේ යෙදීමට අවශ්‍ය හෝ හිතකර නැතහොත් ඊට ආනුෂංගික යම් දෙයක් කිරීමට කාර්යාංශයට බලය තිබිය යුතු ය. කාර්යාංශයේ කාර්යයන් හා බලතල

(2) (1) වන උපවගන්තියෙන් පිරිනමන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව—

(අ) කාර්යාංශයට අයත් මුදල්වලින් මේ පනතේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන යම් මුදල් ප්‍රමාණයක්, සුදුසු යයි මණ්ඩලය සලකන කොටස්, සුරකුම්පත් හෝ තැන්පතු විෂයෙහි ආයෝජනය කිරීමට සහ ඒ කොටස් සහ සුරකුම්පත් විකිණීමට ;

(ආ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කවර වූ හෝ ආකාරයකින් අත්කර ගැනීමට සහ දැරීමට, බද්දට හෝ කුලියට දීමට හෝ ගැනීමට, උකස් කිරීමට, ඔඩපනය කිරීමට, විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට ;

(ඇ) කාර්යාංශයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්යාංශයේ පරමාර්ථ ක්‍රියාවේ යෙදීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හා එකඟවීම්වලට කෙළින්ම හෝ කාර්යාංශයේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් හෝ ඇතුළත් වීමට සහ ඒවා ඉටු කිරීමට ;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ලබා ගන්නා ලද අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, කාර්යාංශය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් සහ එවැනිම ඇප මත කාර්යාංශයේ කාර්ය සඳහා කවර වූ හෝ ප්‍රභවයකින් මුදල් ණයට ගැනීමට ;

(ඉ) ස්වකීය නිලධරයන්, සේවකයන් සහ නියෝජිතයන් පත් කිරීමට, ඔවුන්ගේ සේවය අවසන් කිරීමට, පාරිශ්‍රමික ගෙවීමට සහ පාලනය කිරීමට සහ එහි කටයුතු පරිපාලනය කිරීම හා සම්බන්ධ සියලු කාරණා මෙහෙයවීමට සහ තීරණය කිරීමට ;

(ඊ) කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීමට ;

(උ) කාර්යාංශයේ පරමාර්ථ එළ ගැන්වීම පිණිස ක්‍රම සකස් කිරීමට ;

(ඌ) ශ්‍රී ලාංකිකයන්ගේ සේවාවන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතු සේවා යෝජකයන්ගෙන් ලැබෙන ඉල්ලීම් බාර ගැනීම හා බලපත්‍රලාභීන් අතර බෙදා හැරීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටි නියම කිරීමට ;

(එ) විදේශයන්හි රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් විසින් කාර්යාංශය වෙත ප්‍රේෂණය කරනු ලබන මුදල් ඔවුන් විසින් තෝරාගනු ලබන ආයෝජනවල ආයෝජනය කිරීමට

කාර්යාංශයට බලය තිබිය යුතු ය.

## II වන කොටස

### කාර්යාංශයේ අරමුදල

කාර්යාංශයේ අරමුදල.

17. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) කාර්යාංශයේ අරමුදලක් විය යුතු ය.

(2) (අ) ප්‍රදාන හෝ ණය වශයෙන් හෝ අන්‍යාකාරයෙන් ආණ්ඩුව විසින් කාර්යාංශයට සලසන ලද යම් මුදල් ;

(ආ) මේ පනත යටතේ නියම කොට එකතු කරන ලද යම් සෙස් බද්දකින් ලත් මුදල් ;

(ඇ) ගාස්තු සහ අයකිරීම් වශයෙන් කාර්යාංශය විසින් භාර ගන්නා ලද සියලු මුදල් ;

(ඈ) කාර්යාංශය විසින් කරන ලද යම් ආයෝජනවලින් ලැබෙන ආදායම වශයෙන් කාර්යාංශය විසින් භාර ගන්නා ලද සියලු මුදල් ;

(ඉ) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කාර්යාංශය විසින් භාර ගන්නා ලද සියලු මුදල්

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) අධ්‍යක්ෂවරයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ;

(ආ) කාර්යාංශයේ නිලධරයන්ට, සේවකයන්ට සහ සේවා නියුක්තයන්ට ගෙවිය යුතු වැටුප් ;

(ඇ) කාර්යාංශයේ නියෝජිතයන්ට ගෙවිය යුතු යම් දීමනා ; සහ

(ඈ) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් කාර්යාංශය විසින් දරන ලද යම් වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල්

අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් විගණනය කිරීම.

18. (1) කාර්යාංශයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් ලැබීම් සහ ගෙවීම් පිළිබඳ ප්‍රකාශයක්, ආදායම සහ වියදම පිළිබඳ ප්‍රකාශයක්, වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශයක් සහ එක් එක් ආයෝජනයේ ප්‍රකාශිත වටිනාකම, ගැණුම් මිල සහ වෙළෙඳ වටිනාකම දක්වෙන ආයෝජන පිළිබඳ ප්‍රකාශයක් කාර්යාංශය විසින් පිළියෙළ කරවනු ලැබිය යුතු ය. මේ උපවගන්තිය යටතේ පිළියෙළ කරන ලද එක් එක් ප්‍රකාශයේ පිටපතක්, ඊළඟ වර්ෂයේ සැප්තැම්බර් මස තිස්වන දිනට පෙර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව කාර්යාංශයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

19. කාර්යාංශය විසින්, කාර්යාංශයේ වැඩ පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව පිළියෙළ කොට ඒ වාර්තාව එය අදාළ වන්නා වූ වර්ෂයට පසුව එළඹෙන වර්ෂය ඉකුත්වීමට පෙර, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු ඒ වාර්තාව පාර්ලිමේන්තුවෙහි සභාගත කළ යුතු ය.

වාර්තාව පාර්ලිමේන්තුවෙහි සභාගත කළ යුතු බව.

## III වන කොටස

## නංවාලීම සහ සංවර්ධනය කිරීම

20. (1) ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා නංවාලීම සහ සංවර්ධනය කිරීම සඳහා කාර්යාංශය විසින්—

ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය නංවාලීම සහ සංවර්ධනය කිරීම.

(අ) විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමැතිය යටතේ විදේශ ආණ්ඩු සමග ;

(ආ) විදේශීය සේවායෝජකයන් සහ නියෝජ්‍යායතන සමග ගිවිසුම්වලට එළඹිය හැකි ය.

(2) ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්ති අවස්ථා විවිධාංගකරණ වැඩසටහනක් කාර්යාංශය විසින් ක්‍රියාවේ යෙදිය යුතු ය.

(3) බලපත්‍රලාභීන්ගේ නංවාලීමේ කටයුතුවලදී ඔවුන්ට ආධාර කිරීමේ හා සහාය දීමේ බලය ද ඒ බලපත්‍රලාභීන්ගේ නියෝජිතයන් විදේශ චාරිකාවල යෙදීම සඳහා අනුග්‍රහ දැක්වීමේ බලය කාර්යාංශ යට තිබිය යුතු ය.

21. වෙනත් රටවලින් පැමිණෙන්නන් සඳහා රක්ෂා ලබාගත හැකි යම් පිටරටක කාර්යාංශයේ නියෝජිතයකු හෝ නියෝජිතයන් ලෙස තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි දෙනකු කාර්යාංශය විසින් විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමැතිය යටතේ පත් කරනු ලැබිය හැකි ය. ඒ නියෝජිතයන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් හෝ ඒ රටේ පදිංචිව සිටින ඒ රටේ පුරවැසියන් විය හැකි ය.

කාර්යාංශයේ නියෝජිතයෝ.

22. කාර්යාංශය විසින් ස්වකීය නියෝජිතයන් වශයෙන් යම් පිටරටක පත්කරන ලද තැනැත්තන්—

කාර්යාංශයේ නියෝජිතයන්ගේ කාර්ය.

(අ) ඒ රටෙහි ශ්‍රී ලාංකිකයන්ගේ සේවානියුක්තිය නංවාලීම සම්බන්ධයෙන් වගකීම දැරිය යුතු ය ;

(ආ) ඒ රටෙහි සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ සුභ සාධනය ගැන වගකීම දැරිය යුතු ය ;

(ඇ) සේවායෝජකයන් සමග ආරවුල් බේරුම් කිරීම ඇතුළුව, ඒ රටෙහි සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම ගැන වගකීම දැරිය යුතු ය ;

(ඈ) ඒ රටෙහි සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ පැමිණිලි ගැන සොයා බැලීම සහ ඒ පිළිබඳව සුදුසු පිළියම් ලබාදීම හෝ ඒ පිළියම් සම්බන්ධයෙන් කාර්යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම කළ යුතු ය ;

(ඉ) කාර්යාංශය නියම කරන පරිදි වාරානුකූල වාර්තා එවිය යුතු ය.

හවුල් ව්‍යාපාර.

23. ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය ලබාගැනීම සහතික කරනු පිණිස, රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශයේ ව්‍යවසාය සමග හවුල් ව්‍යාපාර ආරම්භ කිරීමේ බලය කාර්යාංශයට තිබිය යුතු ය.

## IV වන කොටස

## බලපත්‍රලත් විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතන විධිමත් කිරීම

විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතන බලපත්‍ර ලැබිය යුතු බව.

24. (1) කාර්යාංශය හැර වෙනත් යම් තැනැත්තකු විසින් තමා මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකුව සිටිමින් සහ ඒ බලපත්‍රයේ නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූල ආකාරයකින් මිස විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාරය කරගෙන යනු නොලැබිය යුතු ය.

(2) නියමිත දිනයෙහි, 1980 අංක 32 දරන විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතන පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය මත විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාරය කරගෙන යන තැනැත්තකු විසින්, ඒ බලපත්‍රය මේ පනත යටතේ නිකුත් කරනු ලැබුවක් වූ සේම, ඒ බලපත්‍රය අවසන් වන තෙක්, ඒ ව්‍යාපාරය නොකඩව කරගෙන යනු ලැබිය හැකි ය.

කාර්යාංශය විසින් විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතන ව්‍යාපාරය කරගෙන යා හැකි බව.

25. කාර්යාංශය විසින් විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාරය කරගෙන යා හැකි අතර, කාර්යාංශය විසින් ඉටු කරන ලද සේවා සම්බන්ධයෙන් ගාස්තු අය කරනු ලැබිය හැකි ය.

බලපත්‍රයක් ඉල්ලීම.

26. (1) බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම, ලිඛිතව කාර්යාංශය වෙත ඉදිරිපත් කළ යුතු අතර, එහි පහත දැක්වෙන විස්තර ඇතුළත් විය යුතු ය:—

(අ) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය;

(ආ) ඉල්ලුම්කරු පුද්ගලයෙක් ද, ව්‍යාපාරික ආයතනයක් ද, සමාගමක් ද නැතහොත් රාජ්‍ය සංස්ථාවක් ද යන වග;

(ඇ) ඉල්ලුම්කරු—

(i) පුද්ගලයෙක් නම් ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග;

(ii) ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ හවුල්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ද යන වග ;

(iii) සමාගමක් නම්, සමාගමේ ප්‍රාග්ධනයෙහි කොටස් වලින් බහුතරය ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් දරනු ලබන්නේ ද යන වග ;

(ආ) ඉල්ලුම්කරු ව්‍යාපාරික ආයතනයක් හෝ සමාගමක් නම්, ව්‍යාපාරය භාරව සිටින තැනැත්තන්ගේ සම්පූර්ණ නම් සහ ලිපිනයන් ;

(ඉ) ඉල්ලුම්කරු පුද්ගලයෙක් නම් ඔහු සත් කීර්තියක් ඇති තැනැත්තෙක් ද යන වග ;

(ඊ) ඉල්ලුම්කරු ව්‍යාපාරික ආයතනයක් හෝ සමාගමක් වන අවස්ථාවක, ව්‍යාපාරය භාරව සිටින තැනැත්තා සත් කීර්තිමත් තැනැත්තෙක් ද යන වග ;

(උ) ව්‍යාපාරය කර ගෙන යනු ලබන ස්ථානයේ ලිපිනය සහ ඒ ස්ථානයේ ගෙබිම් ප්‍රමාණය සහ ඇති පහසුකම්.

(2) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සහ (ඊ) ඡේදයේ විස්තර, අවස්ථාවෝචිත පරිදි ඉල්ලුම්කරුගේ හෝ ව්‍යාපාරය භාරව සිටින තැනැත්තාගේ චරිතය සහ කීර්තිය පිළිබඳව මෑත දී ලබාගත් චරිත සහතික දෙකකින් සනාථ කරනු ලැබිය යුතු ය.

බලපත්‍රය ප්‍රදානය කිරීමේ කොන්දේසි.

27. (අ) ඉල්ලුම්කරු—

(i) පුද්ගලයකු නම් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම් මිස ;

(ii) ව්‍යාපාරික ආයතනයක් නම් සියලු හවුල්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන ව්‍යාපාරික ආයතනයක් නම් මිස ; නැතහොත්

(iii) සමාගමක් නම් එහි කොටස්වලින් බහුතරය ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් දරනු ලබන සමාගමක් නම් මිස ; සහ

(ආ) ඉල්ලුම්කරු පුද්ගලයකු නම් ඔහු හෝ ව්‍යාපාරික ආයතනයක් හෝ සමාගමක් සම්බන්ධයෙන් වන විට ව්‍යාපාරය භාරව සිටින තැනැත්තා හෝ සත් කීර්තියක් ඇති තැනැත්තකු නම් මිස ; සහ

(ඇ) ස්ථානය පිහිටි ප්‍රදේශය, ස්ථානයේ ප්‍රමාණය සහ එම ස්ථානයේ ඇති පහසුකම් කෙරෙහි සැලකිල්ල ඇතිව, ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානය සුදුසු වන්නේ නම් මිස ;

(ඈ) බලපත්‍රය නිකුත් කිරීම සඳහා නියමිත ගාස්තුව ඉල්ලුම්කරු විසින් ගෙවා ඇත්නම් මිස ;

(ඉ) 28 වන වගන්තියේ නියමයන් අනුව ඉල්ලුම්කරු කටයුතු කර ඇත්නම් මිස

විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාරය පවත්වාගෙන යාමට බලපත්‍රයක් ප්‍රදානය නොකළ යුතු ය.

**බලපත්‍රය නිකුත් කිරීමට පෙර කාර්යාංශය විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූලව ඉල්ලුම්කරු කටයුතු කළ යුතු බව.**

28. (1) මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර—

(අ) (i) සදාචාරාත්මක වශයෙන් නිරවද්‍ය ආකාරයකින් ව්‍යාපාරය පවත්වාගෙන යාමට ; සහ

(ii) විදේශ සේවායෝජකයකු සහ ඉල්ලුම්කරු විසින් ඒ සේවායෝජකයා යටතේ සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලබන තැනැත්තකු අතර වූ යම් සේවානියුක්ති ගිවිසුමක නියමයන් සහ කොන්දේසි ඒ සේවායෝජකයා විසින් පිළිපදිනු ලබන බව සහතික කිරීම පිණිස හැකි යුක්තිසහගත පියවර සියල්ල ගැනීමට

කාර්යාංශය සමග ගිවිසුමකට ඇතුළු වීමට ;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් ව්‍යාපාරය හෝ යම් සේවා නියුක්ති ගිවිසුමක් සම්බන්ධයෙන් උද්ගත විය හැකි හිමිකම් පෑම් පියවීම සඳහා, කාර්යාංශය විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ රුපියල් එක් ලක්ෂයකට නොඅඩු මුදලකට ඇප කරුවන් දෙදෙනකු ඇතිව කාර්යාංශය සමග බැඳුම්කරයකට ඇතුළු වීමට ;

(ඇ) (අ) ඡේදයෙහි සඳහන් ව්‍යාපාරය හෝ යම් සේවා නියුක්ති ගිවිසුමක් සම්බන්ධයෙන් උද්ගත විය හැකි යම් හිමිකම් පෑම් පියවීම සඳහා බලපත්‍රය නිකුත් කිරීමේ දින සිට අනුක්‍රමික මාස විසිහතරක කාලයක් බලාත්මකව පවත්නා කාර්යාංශය විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ රුපියල් එක් ලක්ෂයකට නොඅඩු මුදලකට කාර්යාංශය සෑහීමට පත් වන පරිදි බැංකු ඇප සහතිකයක් සැපයීමට ; සහ

(ඈ) බලපත්‍රය සඳහා නියමිත ගාස්තුව ගෙවීමට

කාර්යාංශය විසින් ඉල්ලුම්කරුට විධාන කළ යුතු ය.

(2) කාර්යාංශය විසින්, බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් කරන රාජ්‍ය සංස්ථාවක් (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදයන්හි සඳහන් නියමයන්ගෙන් නිදහස් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන අනුව ඉල්ලුම්කරු කටයුතු නොකරන අවස්ථාවක, ඒ ඉල්ලුම්කරුට බලපත්‍රයක් ප්‍රදානය කිරීම කාර්යාංශය විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය.

**බලපත්‍රයේ ආකෘතිය සහ බලපවත්නා කාලය.**

29. සෑම බලපත්‍රයක් ම—

(අ) නියමිත ආකෘතිය අනුව විය යුතු ය ; තව ද

(ආ) එය කලින් අවලංගු කරනු ලැබුවේ නම් මිස, එය නිකුත් කරන ලද දින සිට මාස දොළහක කාලයක් බලාත්මක විය යුතු ය.

30. (අ) මේ පනතේ සහ ඒ යටතේ සාදන ලද යම් නියෝග යක සහ මේ පනත යටතේ බලපත්‍රලාභියා ඇතුළු වූ යම් ගිවිසුමක හෝ බැඳුම්කරයක විධිවිධාන බල පත්‍රලාභියා විසින් පිළිපැද ඇති බවට, සහ මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යක් යටතේ යම් වරදකට බලපත්‍රලාභියා වරදකරු කරනු ලැබ නොමැති බවට සහ මේ පනත යටතේ දෙන ලද යම් විධානයක් අනුව බලපත්‍රලාභියා කට යුතු කර ඇති බවට කාර්යාංශය සෑහීමට පත්ව ඇත්නම්; සහ බලපත්‍රයක් අලුත් කිරීම.

(ආ) බලපත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තුව බල පත්‍රලාභියා විසින් ගෙවා ඇත්නම්

බලපත්‍රය අවසන් වීමට පෙර දින තිහකට නොඅඩුව කාර්යාංශය වෙත කරනු ලැබූ ඉල්ලීමක් මත, වරකට එක් වර්ෂයක් නොඉක්මවන කාල සීමාවක් හෝ කාල සීමාවන් සඳහා කාර්යාංශය විසින් බලපත්‍රය අලුත් කරනු ලැබිය හැකි ය.

31. (1) බලපත්‍රලාභියා විසින්— බලපත්‍රයක් අවලංගු කිරීම.

(i) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ මේ පනත යටතේ බලපත්‍රලාභියා ඇතුළු වූ යම් ගිවිසුමක හෝ බැඳුම්කරයක විධිවිධාන කිසිවක් කඩකර ඇති බවට;

(ii) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යක් යටතේ වරදකට වරදකරු කරනු ලැබ ඇති බවට;

(iii) 42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය යටතේ බලපත්‍ර ලාභියාට කාර්යාංශය විසින් නිකුත් කරන ලද යම් විධාන යක් අනුව කටයුතු කර නොමැති බවට;

(iv) මේ පනත යටතේ ගෙවීමට ඔහුට නියම කරනු ලැබූ යම් සෙස් බද්දක් ගෙවීම පැහැර හැර ඇති බවට;

(v) 44 වන වගන්තිය යටතේ කාර්යාංශය විසින් යළි තැනැත් තකුට ගෙවිය යුතු යයි ඔහුට විධාන කරනු ලැබූ යම් මුදලක් ගෙවීම පැහැර හැර ඇති බවට; හෝ

(vi) මේ පනත යටතේ බලපත්‍රලාභියා විසින් යවන ලද යම් ඉල්ලීමක හෝ යම් වාර්තාවක හෝ යම් ලිඛිත තොරතුරක හෝ ලිඛිත කරුණු දැක්වීමක බලපත්‍රලාභියාගේ දැනීම අනුව අසත්‍ය වූ හෝ සාවද්‍ය වූ යම් විස්තර සපයා ඇති බවට

කාර්යාංශය සෑහීමට පත්වුවහොත්, මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් කාර්යාංශය විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) කාර්යාංශයේ තීරණයට විරුද්ධව අභියාචනා කිරීම සඳහා වූ කාලය ඉකුත් වන තෙක් හෝ ඒ කාලය ඇතුළත අභියාචනයක් කරනු ලැබ ඇත්නම්, ඒ අභියාචනය ප්‍රතික්ෂේප නොකරනු ලබ තොත් මිස එසේ කෙරෙන තෙක් (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම බලාත්මක නොවිය යුතු ය.

කාර්යාංශය විසින් ස්වකීය තීරණය ඊට හේතු සමග ඉල්ලුම්කරුට හෝ බලපත්‍රලාභියාට දැන්විය යුතු බව.

32. බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ බලපත්‍රයක් අවලංගු කිරීමට හෝ කාර්යාංශය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, කාර්යාංශය විසින්, අවස්ථාවෝචිත පරිදි ඉල්ලුම්කරුට හෝ බලපත්‍රලාභියාට එකී තීරණය, ඊට පදනම් වූ හේතු සමග දැනුම් දෙනු ලැබිය යුතු ය.

අභියාචනා.

33. (1) (අ) බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරන ; හෝ

(ආ) තම බලපත්‍රය අවලංගු කරන කාර්යාංශයේ තීරණය කින් අතෘප්තියට පත්, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභියා විසින්, ඒ තීරණය ඔහුට දන්වනු ලැබූ දින සිට දින දහහතරක් ඇතුළත, ඊට විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් අභියාචනයක් මත ඒ ලේකම්වරයා විසින්—

(අ) අභියාචනය පිළිගෙන බලපත්‍රයක් ප්‍රදානය කරන ලෙස හෝ අලුත් කරන ලෙස කාර්යාංශයට විධාන කළ හැකි ය ; නැත හොත්

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කාර්යාංශයට නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව කාර්යාංශය ක්‍රියා කළ යුතු ය.

බලපත්‍රලාභියා විසින් යම් ගාස්තුවක් අය නොකළ යුතු බව.

34. යම් තැනැත්තකුට ශ්‍රී ලංකාවෙන් පිටත යම් රටක සේවා නියුක්තිය සැලසීම හෝ ලබා දීම සඳහා 51 වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, අන්‍යාකාරයකින් බලපත්‍රලාභියකු විසින් කිසිම ගාස්තුවක් අය නොකළ යුතු ය.

බලපත්‍රය ප්‍රදර්ශනය කළ යුතු බව.

35. බලපත්‍රලාභියා විසින් ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලබන ස්ථානයෙහි තමාට ප්‍රදානය කරන ලද බලපත්‍රය ප්‍රකට ලෙස ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

විස්තර සම්බන්ධ යම් වෙනසක් බලපත්‍රලාභියා විසින් කාර්යාංශයට දැනුම් දිය යුතු බව.

36. (1) බලපත්‍රයක් සඳහා වූ තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන ලද විස්තර සම්බන්ධයෙන් වන යම් වෙනසක්, එය සිදු වූ දින සිට දින තිහක් ඇතුළත, බලපත්‍රලාභියා විසින් කාර්යාංශය වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(2) බලපත්‍රයේ නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූල නොවන ආකාරයකින් යම් ව්‍යාපාරයක් පවත්වා ගෙන යාමට (1) වන උපවගන්තියේ කිසිවකින් බලපත්‍රලාභියාට බලය නොලැබෙන්නේ ය.

37. (1) කාර්යාංශයේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව, බලපත්‍රලාභියකු විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා තැනැත්තන් ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවමින් යම් ප්‍රචාරක දැන්වීමක් හෝ දැන්වීමක් නිකුත් කිරීම හෝ ඒ සේවානියුක්තිය සම්බන්ධයෙන් නැතහොත් ඊට ආනුෂංගික වෙනත් යම් ක්‍රියාවක් හෝ නොකළ යුතු ය.

කාර්යාංශයේ අනුමතය නොමැතිව බඳවා ගැනීම් සම්බන්ධයෙන් ක්‍රියා නොකළ යුතු බව.

(2) (1) වන උපවගන්තිය යටතේ කාර්යාංශයේ අනුමතය ලබා ගැනීමේ කාර්යය සඳහා බලපත්‍රලාභියා විසින් පහත දැක්වෙන විස්තර කාර්යාංශය වෙත ඉදිරිපත් කළ යුතු ය:—

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත වූ අනාගත සේවායෝජකයාගේ නම සහ ලිපිනය ;

(ආ) තැනැත්තන් බඳවා ගැනීම සඳහා බලපත්‍රලාභියා සහ විදේශ සේවායෝජකයා විසින් ඇතුළත් වූ ගිවිසුමේ හෝ එකඟවීමේ පිටපතක් ;

(ඇ) තැනැත්තන් බඳවා ගනු ලබන්නේ කවර ස්වභාවයක සේවා නියුක්තියක් සඳහා ද යන වග ;

(ඈ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලබන තැනැත්තන්ට සේවායෝජකයා විසින් ඉදිරිපත් කරනු ලබන්නා වූ ද, වේතන, නිවාඩු, වැඩ කරන කාලය සහ ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාවට ගමන් ගාස්තුව යනාදියට අදාළ නියමයන් සහ කොන්දේසි ඇතුළුව සේවා නියුක්තිය පිළිබඳ නියමයන් සහ කොන්දේසි ; සහ

(ඉ) නියම කරනු ලබන වැඩිදුර විස්තර.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද විස්තර ප්‍රමාණවත් නොවන අවස්ථාවක, අවශ්‍ය යයි කාර්යාංශය සලකන අතිරේක විස්තර කාර්යාංශය විසින් කැඳවනු ලැබිය හැකි ය.

(4) තැනැත්තන්ගේ සේවානියුක්තිය පිළිබඳ සාමාන්‍ය ප්‍රමිති අනුව තැනැත්තන් බඳවා ගනු ලබන සේවානියුක්තියේ ස්වභාවය පහත් හෝ අමානුෂික වන බවට හෝ ඒ සේවානියුක්තියේ නියමයන් සහ කොන්දේසි අයුක්ති සහගත බවට කාර්යාංශය සෑහීමට පත්වන යම් අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ අනුමතය ප්‍රදානය කිරීම මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(5) (2) වන සහ (3) වන උපවගන්ති යටතේ කාර්යාංශය වෙත ඉදිරිපත් කරන ලද යම් තොරතුරක්, මේ පනත යටතේ තම කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා කාර්යාංශයේ නිලධරයන්ට හෝ යම් අධිකරණයකට හැර වෙනත් යම් තැනැත්තකුට බලපත්‍රලාභියාගේ කැමැත්ත නොමැතිව කාර්යාංශය විසින් හෙළි නොකළ යුතු ය.

ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා තැනැත්තන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේ දී බලයලත් නිලධරයාට පැමිණ සිටිය හැකි බව.

38. මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානවලට අනුකූලවීම සහතික කිරීමේ කාර්යය සඳහා, 37 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද අනුමතියක් ප්‍රකාර පවත්වනු ලබන ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා තැනැත්තන් බඳවා ගැනීම පිණිස වූ යම් සම්මුඛ පරීක්ෂණයක දී කාර්යාංශය විසින් තත් කාර්යය සඳහා ලිඛිතව බලය දෙන ලද නිලධරයකුට පැමිණ සිටිය හැකි ය. තව ද ඒ නිලධරයාට එසේ පැමිණ සිටීම පිණිස සියලු පහසුකම් සැලසීම ඒ බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

අනුමතය ප්‍රදානය නොකළ හැකි හේතු.

39. (1) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා යම් පංතියකට හෝ වර්ගයකට අයත් තැනැත්තන් බඳවා ගැනීම සඳහා 37 වන වගන්තිය යටතේ අනුමතය ප්‍රදානය කිරීම—

(i) කාර්යාංශයේ මතය අනුව—

(අ) ඒ තැනැත්තන් වෙත අර්පණය කරනු ලබන සේවා නියුක්ති නියමයන් සහ කොන්දේසි සතුටුදායක නොවේ නම්, හෝ

(ආ) ඒ තැනැත්තන් සේවයෙහි නියුක්ත කරනු ලබන රටෙහි ඇති යම් සිවිල් යුද්ධයක් මහජන කැළඹීමක් හෝ දේශපාලන ව්‍යාකූලතා හේතුවෙන් ඔවුන්ගේ ජීවිතය බරපතල අවදානමකට ලක් විය හැකි නම්;

(ii) යෝජිත සේවානියුක්තිය ඒ රටෙහි නීතියෙන් විධිමත් කොට නොමැති නම්

කාර්යාංශය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා යම් පංතියකට හෝ වර්ගයකට අයත් තැනැත්තන් බඳවා ගැනීම සඳහා 37 වන වගන්තිය යටතේ අනුමතය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරන කාර්යාංශයේ තීරණයකින් අතෘප්තියට පත් බලපත්‍රලාභියකු විසින්, ඔහුට ඒ තීරණය දන්වනු ලැබූ දින සිට දින දහහතරක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ යම් අභියාචනයක් කරනු ලැබූ විට, ඒ ලේකම්වරයා විසින්—

(අ) අභියාචනය පිළිගෙන, අභියාචනය අදාළ වන පංතියට හෝ වර්ගයට අයත් තැනැත්තන් බඳවා ගැනීම අනුමත කරන ලෙස කාර්යාංශයට විධාන කළ හැකි ය; නැතහොත්

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කළ හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කාර්යාංශය වෙත නිකුත් කරනු ලැබූ යම් විධානයකට අනුකූලව කාර්යාංශය ක්‍රියා කළ යුතු ය.

40. (1) විදේශ සේවායෝජකයා සහ ඒ සේවායෝජකයා විසින් සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ තැනැත්තා අතර වූ සේවා නියුක්ති ගිවිසුම, ඒ සේවායෝජකයා නැතහොත් ඔහුගේ අනුයෝජිතයා විසින් සහ ඒ තැනැත්තා විසින් අත්සන් කිරීමට පෙර, ඒ තැනැත්තාට වැටහෙන භාෂාවකින් කියවා පැහැදිලි කර දෙනු ලැබිය යුතු ය. සේවානියුක්ති ගිවිසුම.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් ගිවිසුම අත්සන් කරනු ලැබූ වහාම ඒ ගිවිසුමේ පිටපත් දෙකක් කාර්යාංශය විසින් සහතික කරනු පිණිස සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පිටත්වීමට පෙර, බලපත්‍රලාභියා විසින් හෝ ඒ අනුයෝජිතයා විසින් කාර්යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ඒ ගිවිසුමේ පිටපත්, (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කාර්යාංශය විසින් සහතික කරනු ලැබූ වහාම, ඒ බව කාර්යාංශය විසින් ඒ බලපත්‍රලාභියාට හෝ අනුයෝජිතයාට හෝ දැනුම් දෙනු ලැබිය යුතු අතර, ලියාපදිංචි කිරීම පිණිස ඉන් එක් පිටපතක් සේවානියුක්ති ගිවිසුම ඉටුකරනු ලබන්නේ යම් රටක ද ඒ රටේ කම්කරු අමාත්‍යාංශය වෙත කාර්යාංශය විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

41. සෑම බලපත්‍රලාභියකු විසින් ම, නියම කරනු ලබන වාර්තා පවත්වාගෙන යා යුතු ය. වාර්තා පවත්වාගෙන යාම.

42. (1) කාර්යාංශය විසින් ලිඛිත විධානයක් මගින්, ඒ විධානයෙහි නිශ්චිතව සඳහන් දිනයට පෙර— විස්තර වාර්තා.

(අ) බලපත්‍රලාභියා විසින් පවත්වාගෙන යනු ලබන විදේශ සේවා නියුක්ති නියෝජ්‍යායතනයේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් කාර්යාංශයට අවශ්‍ය වන යම් විස්තර ඇතුළත් විස්තර වාර්තාවක් ;

(ආ) බලපත්‍රලාභියා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා යම් තැනැත්තකු බඳවා ගනු ලබන්නේ යම් සේවායෝජකයකු වෙනුවෙන් ද ඒ සේවායෝජකයා විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු කොමිස් මුදල ශ්‍රී ලංකාවේ බැංකුවකට ප්‍රේෂණය කළ බවට සාක්ෂි ; සහ

(ඈ) බලපත්‍රලාභියා විසින් එවන ලද යම් විස්තර වාර්තාවක ප්‍රකාශිත යම් විස්තර සම්බන්ධයෙන් කාර්යාංශයට අවශ්‍ය වන යම් ලිඛිත තොරතුරු හෝ යම් ලිඛිත පැහැදිලි කිරීම්

කාර්යාංශය වෙත එවන ලෙස කවර වූ හෝ අවස්ථාවක දී බලපත්‍රලාභියකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විධානයක් නිකුත් කරනු ලැබූ යම් බලපත්‍රලාභියකු විසින්, ඒ විධානයෙහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ඒ අනුව ක්‍රියා කළ යුතු ය.

කාර්යාංශයේ විධාන.

**43.** බලපත්‍රලාභියකු මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් අනුව ක්‍රියා කරවීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි කාර්යාංශය කල්පනා කරන යම් විධාන, කාර්යාංශය විසින් බලපත්‍රලාභියකු වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, එවැනි යම් විධානයක් නිකුත් කරනු ලැබූ බලපත්‍රලාභියකු විසින් ඒ විධානයෙහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත දී ඒ විධාන අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ තැනැත්තන් විසින් කරනු ලබන පැමිණිලි විභාග කිරීම.

44. (1) (අ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ සේවානියුක්ති ගිවිසුමෙන් ඒ තැනැත්තා වෙනුවෙන් යම් සේවායෝජකයකුට නියම කරනු ලැබූ නියමයන් සහ කොන්දේසි ඒ සේවායෝජකයා විසින් පිළිපැද නැති බවට ; සහ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා ඒ තැනැත්තා බදවා ගත් බලපත්‍රලාභියා, 28 (1) (අ) වගන්තිය යටතේ තමා කාර්යාංශය සමග ඇතුළත් වූ ගිවිසුම් කඩකරමින් එකී නියමයන් සහ කොන්දේසි සේවායෝජකයා විසින් පිළිපදිනු ලබන බව සහතික කිරීමට යුක්තිසහගත ලෙස ගතහැකි පියවර ගැනීම පැහැර හැර ඇති බවට

ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත වූ යම් තැනැත්තකුගෙන් හෝ ඔහු වෙනුවෙන් හෝ පැමිණිල්ලක් හෝ ස්වකීය විදේශ නියෝජිතයන් අතුරින් කිසිවකුගෙන් යම් වාර්තාවක් කාර්යාංශයට ලැබුණු අවස්ථාවක, කාර්යාංශය විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින්, අවශ්‍ය යයි ඔහු සලකන පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව, ඒ පැමිණිල්ලෙහි හෝ වාර්තාවෙහි දක්වා ඇති කාරණා ඔප්පු කරනු ලැබූ බව නිගමනය කළහොත්, ඒ තැනැත්තාට ලැබිය යුතු නොගෙවන ලද වේතන, නිවාඩු දින වෙනුවෙන් වූ ගෙවීම්, නිවාඩු සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ යනාදියේ වටිනාකම සහ සේවායෝජකයා විසින් එම කොන්දේසි කඩ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ තැනැත්තා විසින් දරනු ලැබූ ශ්‍රී ලංකාවට පැමිණීමේ ගමන් ශාස්තු ඇතුළුව වෙනත් වියදම් පියවීම සඳහා ප්‍රමාණවත් යයි ඔහු තීරණය කරන මුදල් ප්‍රමාණයක් ඒ තැනැත්තාට ගෙවන ලෙස බලපත්‍රලාභියාට විධාන කෙරෙන ප්‍රදානයක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් නිලධරයාට (1) වන උපවගන්තිය යටතේ පරීක්ෂණයක් පැවැත්වීමේ කාර්යය සඳහා—

(අ) පරීක්ෂණයෙහි විෂය වන පැමිණිල්ල නැතහොත් වාර්තාව සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම සඳහා බලපත්‍රලාභියාට සහ පැමිණිලිකරුට පැමිණ සිටින ලෙස නියම කිරීමට;

(ආ) පරීක්ෂණයේ කාර්යය සඳහා අවශ්‍ය යයි ඔහු සලකන ලේඛන ඉදිරිපත් කරන ලෙස බලපත්‍රලාභියාට සහ පැමිණිලිකරුට නියම කිරීමට; සහ

(ඇ) යම් තැනැත්තකුට දිවුරුම් පිට හෝ අන්‍යාකාරයකින් තමා ඉදිරිපිට සාක්ෂි දෙන ලෙස නියම කිරීමට

බලය ඇත්තේ ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් නිලධරයා විසින් ඒ උපවගන්තිය යටතේ පවත්වනු ලබන යම් පරීක්ෂණයක දී, එය බලපාන පාර්ශ්වකරුවන්ට කරුණු කියා සිටීමේ අවස්ථාවක් ලබාදිය යුතු ය.

(4) (1) වන උපවගන්තියෙහි සඳහන් නිලධරයා විසින් ඒ වගන්තිය යටතේ යම් තැනැත්තකුට ගෙවන ලෙස බලපත්‍රලාභියකුට විධාන කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක්, විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතනයේ ව්‍යාපාරය පවත්වා ගෙන යාමට ඒ බලපත්‍රලාභියාට දෙන ලද බලපත්‍රය අදාළ වන ස්ථානය පිහිටියේ යම් දිසා අධිකරණයක පරිපාලන සීමා ඇතුළත නම් ඒ දිසා අධිකරණයෙහි ලඝු කාර්ය පටිපාටිය අනුව පවරන ලද නඩුවක් මගින් ඒ තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් කාර්යාංශය විසින් හෝ අයකර ගනු ලැබිය යුතු ය. ලඝු කාර්ය පරිපාටිය යෙදෙන නඩුවලට අදාළ සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන මේ උපවගන්තිය යටතේ වූ නඩුවකට අදාළ විය යුතු ය.

## V වන කොටස

## කම්කරුවන්ගේ සුභසාධන අරමුදල

45. (1) කාර්යාංශය විසින්, (මෙහි මින්මතු "සුභසාධන අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) කම්කරුවන්ගේ සුභසාධන අරමුදලක් ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ යහපත පිණිස පිහිටුවිය යුතු ය. කම්කරුවන්ගේ සුභසාධන අරමුදල.

(2) සුභසාධන අරමුදලට—

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගෙන් ලැබුණු සියලු පරිත්‍යාග සහ දායක මුදල්;

(ආ) විදේශීය සේවායෝජකයන්ගෙන් සහ බලපත්‍රලාභීන්ගෙන් ලැබුණු සියලු පරිත්‍යාග සහ දායක මුදල්;

(ඈ) (අ) සහ (ආ) ඡේදවල සඳහන් නොවන වෙනත් යම් ප්‍රභවයකින් ලැබුණු පරිත්‍යාග සහ දායක මුදල් ;

(ඉ) කාර්යාංශය විසින් සුභසාධන අරමුදලට පවරනු ලබන මුදල් ප්‍රමාණයන්

ගෙවිය යුතු ය.

සුභසාධන අරමුදලට ගෙවිය යුතු මුදල් බැංකුවෙහි තැන්පත් කළ යුතු බව.

46. කාර්යාංශය විසින් භාර ගන්නා ලද සුභසාධන අරමුදලට ගෙවිය යුතු සියලු මුදල් අනුමත කළ බැංකුවක තැන්පත් කළ යුතු අතර "කම්කරුවන්ගේ සුභසාධන අරමුදල් ගිණුම" යනුවෙන් වූ ගිණුමකට බැර කළ යුතු ය.

මේ වගන්තියේ "අනුමත කළ බැංකුව" යන්නෙන්, සුභසාධන අරමුදලට ගෙවිය යුතු මුදල් තැන්පත් කරනු ලැබිය හැකි බැංකුවක් වශයෙන්, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් බැංකුවක් අදහස් වේ.

අරමුදලේ මුදල් ආයෝජනය කිරීමේ බලය.

47. සුභසාධන අරමුදලේ මුදල්, අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ආයෝජනයක කාර්යාංශය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

අරමුදලේ මුදල් යෙදැවීම.

48. (1) කාර්යාංශය විසින්—

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තියෙන් පසුව ශ්‍රී ලංකාවට ආපසු පැමිණෙන ශ්‍රී ලාංකිකයන් සඳහා වූ පුනරුත්ථාපන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කාර්යාංශය විසින් දරන ලද සියලු වියදම් ;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ පවුල්වලට උපදෙස් සහ තොරතුරු සැපයීම සම්බන්ධයෙන් කාර්යාංශය විසින් දරන ලද සියලු වියදම් ;

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ ශ්‍රී ලාංකිකයන් පුහුණු කිරීම සහ හුරු කිරීම සම්බන්ධයෙන් දරන ලද සියලු වියදම් ;

(ඈ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආධාර දීමෙහි ලා දරන ලද සියලු වියදම්

සුභසාධන අරමුදලින් ගෙවිය යුතු ය.

(2) කාර්යාංශයේ යෝජනා සම්මතයක බලය සහිතව මිස සුභසාධන අරමුදලින් කිසිම ගෙවීමක් නොකළ යුතු ය.

*අරමුදලින් ගෙවීම් සඳහා ඇණවුම් චෙක්පත් ආදිය.*

**49.** සුභසාධන අරමුදලේ ගිණුමින් මුදල් ගෙවීම සඳහා වූ සියලු ඇණවුම් හෝ චෙක්පත් සභාපතිවරයා විසින් හෝ තමා වෙනුවෙන් අත්සන් කිරීමට සභාපතිවරයා විසින් බලය දෙනු ලැබූ අධ්‍යක්ෂවරයකු විසින් සහ තත් කාර්යය සඳහා කාර්යාංශය විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ නිලධරයන් අතුරින් වෙනත් එක් නිලධරයකු විසින් අත්සන් කරනු ලැබිය යුතු අතර සුභසාධන අරමුදලේ ගිණුමේ මුදල් තැන්පත් කොට ඇති බැංකුව විසින් එසේ අත්සන් කරන ලද ඒ ගිණුම මත වූ සියලු ඇණවුම්වලට හෝ චෙක්පත්වලට ගෙවිය හැකි ය.

*සුභසාධන අරමුදල සම්බන්ධයෙන් ලැබීම් සහ ගෙවීම් ආදිය පිළිබඳ ප්‍රකාශය.*

**50.** මණ්ඩලයේ එක් එක් රැස්වීමේ දී සුභසාධන අරමුදල් සම්බන්ධයෙන් ලැබීම් සහ ගෙවීම් පිළිබඳ ප්‍රකාශයක් සභාපතිවරයා විසින් මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.

## VI වන කොටස

### ගෙවීම් සහ සෙස් බද්ද

*බඳවා ගනු ලබන්නන් විසින් ගෙවීම.*

**51.** (1) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලබන සෑම තැනැත්තකු විසින් ම රුපියල් දෙදහස් පන්සියයක මුදලක් කාර්යාංශයට ගෙවිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බඳවා ගනු ලබන සෑම තැනැත්තකු විසින් ම, ඔහු ශ්‍රී ලංකාවෙන් පිටත්ව යාමට පෙර කාර්යාංශය විසින් සලසන ලද පහසුකම් සඳහා ගෙවීමක් වශයෙන් රුපියල් දෙසියයක මුදලක් කාර්යාංශයට ගෙවිය යුතු ය.

(3) කාර්යාංශය විසින් අනුමත කරන ලද යම් බැංකුවක් මගින් කාර්යාංශයට ගෙවීම් කරනු ලැබිය යුතු ය.

(4) බලපත්‍රලාභියකු විසින් යම් තැනැත්තකු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සලසනු ලැබූ හෝ ලබා දී ඇති අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ ඒ තැනැත්තා විසින් කාර්යාංශයට ගෙවන ලද මුදලින්, රුපියල් දෙදහසක මුදලක් කාර්යාංශය විසින් බලපත්‍රලාභියාට ගෙවිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ ගෙවීමට බඳවා ගනු ලබන්නකුට නියම කරනු ලබන මුදල සම්පූර්ණයෙන් ගෙවීමට ඔහුට නොහැකි බවට පරීක්ෂණයකින් පසුව කාර්යාංශය සෑහීමට පත්වන අවස්ථාවක, කාර්යාංශය විසින් අනුමත කරන ලද යම් බැංකුවක් මගින් ඒ බඳවා ගනු ලබන්නා විසින් වාරිකවලින් ගෙවීම කිරීම පිණිස කාර්යාංශය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(6) බැංකුවක් මගින් කාර්යාංශයට ගෙවීම් කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

සෙස් බද්ද.

52. (1) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා යම් තැනැත්තකු බඳවා ගැනීම සම්බන්ධයෙන් බලපත්‍රලාභියකු විසින් ලබා ගත් සෑම කොමිස් මුදලකින්ම සියයට පහක අනුප්‍රමාණයෙන් ගණන් බලනු ලැබූ සෙස් බද්දක් සෑම බලපත්‍රලාභියකු කෙරෙහි නියම කොට අය කළ යුතු ය.

(2) සෑම බලපත්‍රලාභියකු විසින් ම, ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා තැනැත්තන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ඉකුත් මාසයේදී ඔහු ලබා ගත් කොමිස් මුදල පිළිබඳ වාර්තාවක් සෑම මාසයක පහළොස්වන දිනට පෙර කාර්යාංශය වෙත සැපයිය යුතු ය.

(3) සෑම බලපත්‍රලාභියකු විසින් ම, මේ වගන්තිය යටතේ ඔහු ගෙවිය යුතු සෙස් බද්ද ඒ සෙස් බද්ද අය කෙරෙන්නේ යම් කොමිස් මුදලක් සම්බන්ධයෙන් නම් ඒ කොමිස් මුදල ලැබීමේ දින සිට මාස තුනක් ඇතුළත කාර්යාංශයට ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ නියම කර අය කරනු ලබන සෙස් බද්ද තක්සේරු කිරීම, එකතු කිරීම සහ අයකර ගැනීම නියෝග මගින් නියම කරන ලද පරිදි විය යුතු ය.

## VII වන කොටස

### තොරතුරු දත්ත බැංකුව

තොරතුරු දත්ත බැංකුව.

53. (1) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත වන සහ ඒ සේවානියුක්තිය නිමවීමෙන් පසුව පෙරළා පැමිණෙන ශ්‍රී ලාංකිකයන් සම්බන්ධයෙන් තොරතුරු දත්ත බැංකුවක් කාර්යාංශය විසින් පැවැත්විය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා තමා විසින් බඳවා ගනු ලබන ශ්‍රී ලාංකිකයන් පිළිබඳ නියමිත තොරතුරු සෑම බලපත්‍රලාභියකු විසින්ම කාර්යාංශය වෙත සැපයිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා බැහැර යන සෑම ශ්‍රී ලාංකිකයකු විසින් ම, එසේ පිටත් වී යාමට පෙර කාර්යාංශය වෙත ලියාපදිංචි විය යුතු ය.

## VIII වන කොටස

### බලපත්‍රලත් විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතන සංගමය

බලපත්‍රලත් විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතන සංගමය පිහිටුවීම.

54. (1) නියමිත දිනට පසු, හැකි ඉක්මණින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) බලපත්‍රලත් විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතන සංගමය අමාත්‍යවරයා විසින් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන සංගමය සංස්ථාවක් විය යුතු අතර, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඊට තිබිය යුතු ය. තවද, ඒ සංගමය පිහිටුවීමේ නියමය මඟින් ඊට දෙනු ලබන නාමයෙන් නඩු පැවරීම ද, නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

(3) සෑම බලපත්‍රලාභියකුම සංගමයේ සාමාජිකයකු විය යුතු ය.

55. සංගමයේ කර්තව්‍ය— සංගමයේ කර්තව්‍ය.

(අ) බලපත්‍රලාභීන් අතර ආරාවුල් සහ මත භේද විසඳීම;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය නංවාලීම සහ විධිමත් කිරීම සම්බන්ධයෙන් කාර්යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඇ) ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්ති අවස්ථා නංවාලීම පිළිබඳව උපදෙස් දීම සහ එහිලා සහාය වීම;

(ඈ) බලපත්‍රලාභීන් සඳහා චර්යාධර්ම සංග්‍රහයක් සකස් කිරීම සහ එය ක්‍රියාවේ යෙදෙන බව සහතික කිරීම;

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීම හා සම්බන්ධ කාරණා පිළිබඳ ව කාර්යාංශයට සහ අමාත්‍යවරයාට කරුණු ඉදිරිපත් කිරීම

විය යුතු ය.

56. (1) සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික සහ සාමාජිකයන් විසින් තමන් අතුරින් තත්කාර්ය සඳහා තෝරා පත් කරගනු ලැබූ වෙනත් සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත වන සංගමයේ විධායක කාරක සභාව විසින් සංගමයේ කටයුතු පරිපාලනය කළ යුතු ය. සංගමයේ කටයුතු පිළිබඳ කළමනාකරණය.

(2) සංගමයේ විධායක කාරක සභාවේ ධුර කාලය එක් වර්ෂයක් විය යුතු ය.

57. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංගමය වෙනුවෙන් සංගමයේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීමට, ඉටු කිරීමට සහ ක්‍රියාවේ යෙදවීමට සංගමයේ විධායක කාරක සභාවට බලය ඇත්තේ ය. සංගමයේ සාමාන්‍ය බලතල.

58. සංගමයේ විධායක කාරක සභාව තෝරා පත්කිරීම සඳහා සහ සංගමයේ හා විධායක කාරක සභාවේ රැස්වීම් කැඳවීම සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය. එවැනි යම් නියෝගයකට යටත්ව, සංගමය විසින් සහ විධායක කාරක සභාව විසින් ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකිය. සංගමයේ කාර්ය පටිපාටිය ආදිය.

## IX වන කොටස

### කාර්යාංශයේ කාර්ය මණ්ඩලය

නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

59. (1) ස්වකීය කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි කාර්යාංශය සලකන නිලධරයන් සහ සේවකයන් කාර්යාංශය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන නිලධරයන්ට සහ සේවකයන්ට කාර්යාංශය විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් සහ අනුප්‍රමාණ මත පාරිශ්‍රමික ගෙවිය යුතු අතර, ඔවුන් කාර්යාංශය විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) කාර්යාංශයේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, කාර්යාංශය විසින් ඒ සමාන කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන කාලයකට කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(4) රජයේ සේවයේ යම් නිලධරයකු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රජයේ සේවයේ යම් නිලධරයකු කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වූ යම් තැනැත්තකු කාර්යාංශය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් කාර්යාංශයට සේවය කරන කාලය ගිවිසුමේ බැඳීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට සේවය කරන ලද කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) කාර්යාංශයේ ඉල්ලීම පිට අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක හෝ සංවර්ධන සභාවක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ පළාත් පාලන ආයතනයේ හෝ සංවර්ධන සභාවේ කැමැත්ත ඇතිව, කාර්යාංශය විසින් එවැනිම කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන

කාලයක් සඳහා කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් කාර්යාංශය සහ අවස්ථෝචිත පරිදි, පළාත් පාලන සේවා උපදේශක සභාව හෝ ඒ පළාත් පාලන ආයතනය හෝ සංවර්ධන සභාව විසින් එකඟවන විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියමයන් සහ කොන්දේසි ඇතුළු යම් නියමයන් සහ කොන්දේසි මත, ඒ කාර්යාංශයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(8) කාර්යාංශයේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව එවැනිම කැමැත්ත ඇතිව කාර්යාංශය විසින් තීරණය කරනු ලබන යම් කාලයකට කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් කාර්යාංශය සහ ඒ රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් එකඟවන විශ්‍රාම වැටුප්වලට සහ අර්ථසාධක අරමුදල්වලට අදාළ නියමයන් සහ කොන්දේසි ඇතුළු යම් නියමයන් සහ කොන්දේසි මත ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(9) (7) වන උපවගන්තිය හෝ (8) වන උපවගන්තිය අනුව කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට යම් තැනැත්තකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයටම යටත් විය යුතු ය.

## X වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

ඇතුල්වීමේ, පරීක්ෂා කිරීමේ සහ ප්‍රශ්න කිරීමේ බලතල.

**60.** (1) කාර්යාංශය විසින් තත්කාර්යය සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ කාර්යාංශයේ යම් නිලධරයකු විසින්—

(අ) මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද යම් නියෝග අනුව ක්‍රියා කරනු ලබන්නේදැයි දැනගැනීමේ කාර්යය සඳහා විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන ස්ථානයකට, දිවා කාලයේ හෝ රාත්‍රි කාලයේ යම් යුක්ති සහගත වේලාවක දී ඇතුල් වී එය පරීක්ෂා කිරීමට;

(ආ) මේ පනතින් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයකින් හෝ ඒ යටතේ හෝ ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් තබාගත යුතු යයි නියම කර ඇති යම් වාර්තා පරීක්ෂා කිරීම සහ ඒවායේ පිටපත් ගැනීම; සහ

(ඇ) ඒ ස්ථානයේ සිටින යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ දී ඒ නිලධරයාට බාධා කරන හෝ ප්‍රතිරෝධය පාන සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන

අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට සහ මාස දොළහකට නො අඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

නියෝග.

**61.** (1) නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇත්තා වූ හෝ නියම කළ යුතු යයි මේ පනතින් නියමිතව ඇත්තා වූ කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට, ඒ නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක්, එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු ය.

බලය නොමැතිව රැඳවා ගැනීම වරදක් බව.

**62.** (1) මේ පනතේ විධිවිධාන අනුව හැර—

(අ) සේවානියුක්ති කාර්ය සඳහා ශ්‍රී ලංකාවෙන් විගමනය කිරීමට හෝ පිටත්ව යාමට යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකුට සහාය දීමට අදහස් කෙරෙන යම් ගිවිසුමක් යම් තැනැත්තකු සමග ඇති කර ගන්නා හෝ ඇති කර ගැනීමට උත්සාහ කරන නැතහොත් ඒ තැනැත්තාගෙන් යම් මුදලක් ඉල්ලා සිටින හෝ භාර ගන්නා වූ;

(ආ) යම් තැනැත්තකු සේවානියුක්ති කාර්ය සඳහා ශ්‍රී ලංකාවෙන් විගමනය කිරීමට හෝ පිටත්ව යාමට නැතහොත් විගමනය කිරීමට හෝ පිටත්ව යාමට උත්සාහ කිරීමට නැතහොත් විගමනය කිරීම පිණිස හෝ පිටත්ව යාම පිණිස යම් ස්ථානයකින් බැහැරව යාමට සලස්වන හෝ ආධාර කරන හෝ සැලැස්වීමට හෝ ආධාර කිරීමට උත්සාහ කරන

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට සහ මාස දොළහකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ තත්කාර්යය සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් නොමැතිව, විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාරය කරගෙන යන සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් දසදහසකට නො අඩු සහ රුපියල් පහළොස් දහස නොඉක්මවන දඩයකට ද වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද නොකඩවා කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් දෙසියයක අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

(3) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව මිස, මේ වගන්තිය යටතේ කිසිදු නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

ව්‍යාජ ලේඛන කිරීම හෝ පෙළඹවීම වරදක් වේ.

63. (අ) සේවානියුක්ති කාර්යය සඳහා යම් තැනැත්තකුගේ විගමනයට අවශ්‍ය හෝ අදාළ යම් ලේඛනයක් කූට ලෙස සකස් කරන්නා වූ හෝ වෙනස් කරන්නා වූ හෝ ඒ කූට ලිපි සැකසීමේ හෝ වෙනස් කිරීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන යම් උපකරණයක් හෝ දෙයක් තමාගේ සන්තකයෙහි හෝ පාලනය යටතේ තබා ගන්නා වූ; හෝ

(ආ) මත් කිරීමෙන්, බලකිරීමෙන්, වංචා කිරීමෙන් හෝ සිතාමතා වැරදි කරුණු ප්‍රකාශ කිරීමෙන් යම් තැනැත්තකු විගමනය කිරීමට හෝ විගමනය කිරීම පිණිස යම් ගිවිසුමකට ඇතුළු වීමට හෝ සේවා නියුක්ති කාර්යය සඳහා විගමනය කිරීමේ අරමුණ ඇතිව යම් ස්ථානයකින් පිටත්ව යාමට මෙහෙයවන්නා වූ හෝ පොළඹවන්නා වූ හෝ මෙහෙයවීමට හෝ පෙළඹවීමට උත්සාහ කරන්නා වූ

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට සහ මාස දෙළහකට නොඅඩු සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

ගාස්තු අය කිරීම වරදක් වේ.

64. (අ) යම් තැනැත්තකු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සැලසීමේ හෝ ලබා දීමේ කාර්ය සඳහා 51 වන වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි හැර අන්‍යාකාරයකින් යම් ගාස්තුවක් අයකරන බලපත්‍රලාභියකු වන යම් තැනැත්තකු;

(ආ) යම් තැනැත්තකු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සැලසීමේ හෝ ලබා දීමේ කාර්ය සඳහා තමා හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් මුදලක් ඉල්ලන හෝ භාරගන්නා හෝ භාර ගැනීමට උත්සාහ කරන බලපත්‍රලාභියකු නොවන යම් තැනැත්තකු

මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු

කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට සහ මාස දෙළහකට නොඅඩු සහ අවුරුදු දෙකක් නොඉක්ම වන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් විය යුතු ය. ඊට අතිරේකව වරදෙහි විෂයය කාරණය වන ගාස්තුවක් හෝ මුදලක් වරදකරු විසින් භාරගනු ලැබුවේ යම් තැනැත්තකු ගෙන්ද ඒ තැනැත්තාට ඒ ගාස්තුව හෝ මුදල ආපසු ගෙවීමට ද මහෙස්ත්‍රාත්වරයා විසින් වරදකරුට ආඥාවක් කළ යුතු ය.

වාර්තා ආදියට අදාළ වැරදි.

65. (අ) මේ පනත යටතේ සැපයීමට යම් තැනැත්තකුට නියම කරන ලද යම් වාර්තාවක් තොරතුරක් හෝ පැහැදිලි කිරීමක් සැපයීම පැහැර හරින හෝ තමාගේ දැනීම අනුව අසත්‍ය සහ සාවද්‍ය යම් විස්තර ඇතුළත් යම් වාර්තාවක් ලිඛිත තොරතුරක් හෝ ලිඛිත පැහැදිලි කිරීමක් සපයන ;

(ආ) මේ පනත යටතේ පවත්වනු ලබන යම් පරීක්ෂණයක දී තමාගේ දැනීම අනුව අසත්‍ය හෝ සාවද්‍ය වූ යම් සාක්ෂියක් දෙන ; හෝ

(ඇ) 44 වන වගන්තිය යටතේ කරන ලද යම් ප්‍රදානයක නියමයන් අනුව කටයුතු කිරීම පැහැර හරින

යම් තැනැත්තකු, මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් එක් දහස් පන්සියයක් නො ඉක්මවන දඩයකට සහ මාස දොළහකට නො අඩු සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

පරීක්ෂණයකට අදාළ වැරදි.

66. (අ) 44 (2) (අ) වගන්තිය යටතේ නියම කරනු ලැබූ විට යුක්ති සහගත හේතුවක් නොමැතිව පරීක්ෂණයක දී පැමිණ සිටීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන ;

(ආ) ඒ ඡේදය යටතේ ප්‍රශ්න කරනු ලැබූ විට උත්තර දීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන ;

(ඇ) 44 (2) (ආ) වගන්තිය යටතේ ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබූ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන ;

(ඈ) 44 (2) (ඇ) වගන්තිය යටතේ නියම කරනු ලැබූ විට සාක්ෂි දීම පිණිස දිවුරුම් දීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන

යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහසකට නො අඩු සහ රුපියල් එක් දහස් පන්සියයක් නො ඉක්මවන දඩයකට සහ මාස දොළහකට නො අඩු සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරක බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

**67.** (අ) 35 වන වගන්තියේ හෝ 36 වන වගන්තියේ හෝ 40(1) වන වගන්තියේ හෝ 41 වන වගන්තියේ හෝ 53 වන වගන්තියේ විධිවිධාන ; හෝ

(ආ) 42 වන වගන්තියෙන් හෝ 43 වන වගන්තියෙන් හෝ 52 වන වගන්තියෙන් හෝ ඒ යටතේ තමාට කරන ලද යම් නියමයක්

අනුව කටයුතු කිරීම පැහැර හරින සෑම බලපත්‍රලාභියකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් එක් දහස් පන්සිය යක් නො ඉක්මවන දඩයකට සහ මාස දොළහකට නොඅඩු සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය. විවිධ වැරදි.

**68.** 63 වන වගන්තිය හෝ 64 වන වගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු ඒ වගන්තියක් යටතේම වරදකට තදනන්තරව වරදකරු කරනු ලැබූ විට, දෙවන හෝ තදනන්තර වැරදි සඳහා වරදකරු කරනු ලැබීම මත ඒ වගන්තියෙන් ඒ වරද සඳහා විධිවිධාන සලස්වනු ලැබූ දඬුවම මෙන් දෙගුණයක දඬුවමකට ඔහු යටත් විය යුතු ය. 63 වන හෝ 64 වන වගන්තිය යටතේ තදනන්තර වැරදි සඳහා දඬුවම.

**69.** මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන අවස්ථාවක— පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වැරදි.

(අ) පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධර යකු වූ සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවන වෙනත් මණ්ඩල යක් නම් වරද කරනු ලැබූ අවස්ථාවේ දී මණ්ඩලයේ සාමා ජිකයකු වූ සෑම තැනැත්තකුම

වරදකට වරදකරු විය යුතු ය :

එසේ වුව ද වරද කරනු ලැබුවේ තමාගේ දැනීම නොමැතිව බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට තමා නිසි උදෙස්ගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කළහොත් ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ සාමාජිකයා ඒ වරදට වරදකරු ලෙස නොසැලකිය යුතු ය.

**70.** 1980 අංක 32 දරන විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතන පනත මේ පනතින් ඉවත් කරනු ලැබුව ද, 1980 අංක 32 දරන පනතේ 6 වන වගන්තිය යටතේ බලපත්‍රලාභියකු විසින් කම්කරු කොමසාරිස්වරයා සමග ඇතුළත් වූ සියලු ගිවිසුම් සහ බැඳුම්කර ඒ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවසන් වන තෙක් වලංගු සහ බලසහිත විය යුතු ය. තව ද, කම්කරු කොමසාරිස්වරයා වෙනුවට කාර්යාංශය එහි නම් කරනු ලැබුවාක් මෙන් හෝ ඊට පාර්ශ්වයක් කරනු ලැබුවාක් මෙන් සම්පූර්ණයෙන් සහ බලසහිතව ක්‍රියාත්මක කළ හැකි විය යුතු ය. අන්තර්කාලීන විධිවිධාන.

1980 අංක 32 දරන පනත ඉවත් කිරීම.

**71.** 1980 අංක 32 දරන විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතන පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

අර්ථ නිරූපණය.

**72.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාරය" යන්නෙන් තැනැත්තන්ට ශ්‍රී ලංකාවෙන් පිටත සේවායෝජකයන් වෙත සේවානියුක්තිය ලබාදීමේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සේවායෝජකයන්ට ශ්‍රී ලාංකික ශ්‍රමය සැපයීමේ කාර්යය සඳහා (තොරතුරු සැපයීමෙන් වුව ද අන්‍යාකාරයකින් වුව ද) සේවා සැලසීමේ (ගාස්තු අයකිරීමෙන් හෝ අන්‍යාකාරයෙන් කරගෙන යනු ලැබුව ද නැත ද, වෙනත් යම් ව්‍යාපාරයක් සමඟ සම්බන්ධ කොට පැවැත් වූන ද නැත ද) ව්‍යාපාරය අදහස් වන අතර, ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා තැනැත්තන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවන ප්‍රචාරක දැන්වීමක් හෝ නිවේදනයක් නිකුත් කිරීම හෝ ඒ සේවානියුක්තිය හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වෙනත් යම් ක්‍රියාවක් කිරීම ඊට ඇතුළත් වේ;

"සභාපතිවරයා" යන්නෙන් මණ්ඩලයේ සභාපතිවරයා අදහස් වේ;

"සේවායෝජකයා" යන්නට සේවායෝජක මණ්ඩලයක් ඇතුළත් වේ;

"බලපත්‍රය" යන්නෙන් මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අදහස් වේ;

"බලපත්‍රලාභියා" යන්නෙන් විදේශ සේවානියුක්ති නියෝජ්‍යායතනයක ව්‍යාපාරය කරගෙන යාමට මේ පනත යටතේ බලපත්‍ර දෙනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් පනත හැර වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ හෝ පිහිටුවන ලද්දාවූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"පෞද්ගලික අංශයේ ව්‍යවසාය" යන්නෙන් සේවායෝජකයකු විසින් පෞද්ගලික අංශයෙහි කරගෙන යනු ලබන යම් ව්‍යවසායක් අදහස් වන අතර, ස්වයං සේවානියුක්ත තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යවසායක් ඊට ඇතුළත් වේ.